පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) - 2024 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා කාලය සඳහා

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2024 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා කාලය සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2011 ඔක්තෝබර් 21 දිනැති 2790-එස්ආර්අයි (එස්එෆ්) අංක දරන සහ 2016 නොවැම්බර් 02 දිනැති 3431 - එස්ආර්අයි (එස්එෆ්) අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව(ADB) අතර ගිවිසුම්ගත ණය ගිවිසුමේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුමට අනුව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන අතර පළාත් 07 ක පළාත් සභා ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ ආයතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ව්‍යාපෘතියේ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ වගකිවයුතු සහ මූල්‍යමය හා තාක්ෂණික වශයෙන් ශක්තිමත් කරන ලද පළාත් පාලන ආයතන හරහා සේවා ඵලදායී ලෙස සැපයීමයි. ව්‍යාපෘතියේ පසුකාලීන ණයවල අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පළාත් 07 ක නිදන්ගත රෝගවලින් පීඩාවට පත් අඩු සංවර්ධිත ප්‍රදේශවල පළාත් පාලන ආයතන සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන යටිතල පහසුකම් සහ සේවාවන් වැඩිදියුණු කිරීමයි.

ණය ගිවිසුම 2790 එස්ආර්අයි (එස්එෆ්) අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 68.8 ක් වූ අතර එය රුපියල් මිලියන 8,940 කට සමාන වූ අතර එම ඇමෙරිකානු ඩොලර් මිලියන 59 ක් රුපියල් මිලියන 7,670 කට සමාන වන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. පසුව ඇති වූ ණය ගිවිසුම අංක 3431 එස්ආර්අයි (එස්එෆ්) අනුව, මුල් ව්‍යාපෘතියේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා 2017 වර්ෂයේදී රුපියල් මිලියන 8,700 කට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 60 ක අතිරේක ණයක් ලබා ගන්නා ලදී.

ව්‍යාපෘතිය එහි ක්‍රියාකාරකම් 2012 ජූලි 01 වන දින ආරම්භ කර 2015 ජූනි 30 වන දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීමේ දිනය 2024 ජනවාරි 31 දක්වා දීර්ඝ කර තිබුණි.

1.3 මතය

ව්‍යාපෘතියේ 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

2. භෞතික කාර්ය සාධනය

2.1 ස්ථාන චාරිකාවලදී කරන ලද නිරීක්ෂණ

2.1.1 බහුකාර්ය ගොඩනැගිලි

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශයන්
(අ)	හල්දුම්මුල්ල - රුපියල් මිලියන 12.46 ක වියදමින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමෙන්, ළමා හා මාතෘ සායන හරහා වසරකට මව්වරුන් 200 ක් සහ දරුවන් 150 ක් සඳහා සහ ආයුර්වේද සායනය හරහා පුද්ගලයින් 1,200 ක් සඳහා සේවා සැපයීමට සැලසුම් කර තිබූ අතර, එයින් අපේක්ෂිත වාර්ෂික ප්‍රතිලාභය රු. 710,000 කි. කෙසේ වෙතත්, ළමා හා මාතෘ සායන අපේක්ෂිත පරිදි පවත්වා නොතිබුණි.	මෙම සභාවේ බහුකාර්ය ගොඩනැගිල්ල එම කටයුතු සඳහා යොදා නොගන්නා අතර, එම ගොඩනැගිල්ල විවිධ කාර්යයන් සඳහා ශ්‍රවණාගාරයක් ලෙස භාවිතා කරන අතර, මෙම සභාව එම කටයුතුවලින් ආදායමක් උපයා ගනී.	ව්‍යාපෘති අරමුණු සඳහා වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	**ඉඹුල්පේ** - පුස්තකාලයක්, පෙර පාසලක්, සෞඛ්‍ය මධ්‍යස්ථානයක්, ආයුර්වේද මධ්‍යස්ථානයක් සහ ළමා හා මාතෘ සායන පවත්වාගෙන යාම සඳහා රුපියල් මිලියන 42.0 ක මුදලක් වැය කර ඉදිකරන ලද මෙම බහුකාර්ය ගොඩනැගිල්ල 2016 වර්ෂයේදී සභාව විසින් පවරාගෙන තිබුණද, එය අපේක්ෂිත කාර්යය සඳහා යොදාගෙන නොතිබුණි. පසුව, ගොඩනැගිල්ල තක්සේරු නොකර, ටෙන්ඩර් කැඳවීමකින් සහ නිසි බදු ගිවිසුමකින් තොරව 2022 දී එම ගොඩනැගිල්ල කුලියට දී ඇති අතර, බදු ගැනුම්කරු විසින් 2023 ජූනි මාසය දක්වා ගෙවිය යුතු රුපියල් මිලියන 1.1 ක මුදල අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.	මෙම ගොඩනැගිල්ල මුල් සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් සඳහා යොදාගෙන නොමැති වුවද, එය වෙනත් අරමුණු සඳහා යොදාගෙන ඇත.	ව්‍යාපෘති අරමුණු සඳහා වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**අයගම** - අයගම නගරයේ රුපියල් මිලියන 30.58 ක වියදමින් ඉදිකරන ලද බස් නැවතුම්පොළේ ඉහළ මහලේ කුටි පහක් සහ පොදු වැසිකිළි පද්ධතිය 2017 මැයි සිට මේ දක්වා අයගම පොලිසිය විසින් භාවිතා කිරීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට	මුල් සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් සඳහා මෙම බහුකාර්ය ගොඩනැගිල්ල යොදාගෙන නොමැති වුවද, එය වෙනත් අරමුණු සඳහා යොදාගෙන ඇත.	ව්‍යාපෘති අරමුණු සඳහා වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළයුතුය.

	නොහැකි විය. සමාලෝචනයට ලක්වන වර්ෂයට අදාළව අයගම පොලිස් ස්ථානයෙන් අයකර ගත යුතු රුපියල් මිලියන 5.42 ක කුලිය 2025 ජූලි වන විටත් අයකරගෙන නොතිබුණි.		
(ඇ)	**ඉපලෝගම** - රුපියල් මිලියන 40.79 ක වියදමින් ඉදිකරන ලද ගොඩනැගිල්ලේ පහළ මහලේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්, පෙර පාසලක් සහ වෛද්‍ය සායනයක් සහ ඉහළ මහලේ ශ්‍රවණාගාරයක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා වෙන් කරන ලද කොටස සහ වෛද්‍ය සායනය සඳහා වෙන් කරන ලද කාමර 05 න් එකක් කිසිදු ගාස්තුවක් අය නොකර පුද්ගලික භාවිතය සඳහා ලබා දී තිබුණි. අනෙක් කාමර නිෂ්ක්‍රීයව පැවතුනි. 2017 සිට 2025 ජූලි 31 දක්වා කාලය තුළ ඉහළ මහලේ ශ්‍රවණාගාරයෙන් රු. 603,050 ක ආදායමක් පමණක් උපයා තිබුණි. ඒ අනුව, ඉහළ සහ පහළ මහලෙන් අපේක්ෂිත ආදායම් ඉලක්ක සපුරා ගැනීමට ප්‍රාදේශීය සභාව අපොහොසත් වී තිබුණි.	2017 වර්ෂයේ සිට 2025.08.31 දක්වා කාලය තුළ සියලුම ක්‍රියාකාරකම් සාර්ථකව සිදු කර ඇති අතර, මෙම ගොඩනැගිල්ල මුදල් ඉපයීමේ එකම අරමුණින් ඉදිකරන ලද්දක් නොවන අතර එය ප්‍රජාවගේ සුභසාධනය සඳහා ද ඉදිකරන ලද්දකි.	ව්‍යාපෘති අරමුණු සඳහා වත්කම් ඵලදායී ලෙස යුදපයෝජනය කිරීමට කටයුතු කළ තුය.
(ඉ)	**ගලෙන්බිඳුණුවැව** - රුපියල් මිලියන 34.8 ක මුදලක් වැය කර ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරය කුලියට දීමෙන් 2021 වර්ෂයේ සිට 2025 ජූලි දක්වා කාලය තුළ රු. 405,750 ක ආදායමක් පමණක් උපයා තිබුණි. පෙර පාසලක් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමෙන් පිළිවෙලින් රු. 54,000 සහ රු. 240,000 ක වාර්ෂික ආදායමක් අපේක්ෂා කළද, අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර නොගත් බැවින් ප්‍රදේශයේ ජනතාවට ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ සහ ආදායම ලබා ගැනීමට නොහැකි විය. ඉහළ මහලේ ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.	වර්තමානයේ ශ්‍රවණාගාරය සහ පුස්තකාලය භාවිතා කරනු ලැබේ. ආදායම් උත්පාදනය සඳහා මෙම ශ්‍රවණාගාරයේ වෙනත් කිසිදු වැඩසටහනක් පවත්වනු නොලබන අතර එය විවිධ ආයතන සඳහා රැස්වීම් සහ වැඩසටහන් පැවැත්වීම සඳහා පමණක් සපයනු ලැබේ.	ව්‍යාපෘති අරමුණු සඳහා වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

(ඊ)	**අඹන්ගඟ කෝරළය** - මෙම ගොඩනැගිල්ල රු. මිලියන 44.99 ක් වැය කර ඉදිකර ඇති අතර නගරයෙන් පිටත දුෂ්කර ගමක ඉදිකර ඇති බැවින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට අපොහොසත් වී ඇති බැවින් එය භාවිතා කිරීමට නොහැකි විය. ඉහළ මහලේ ඊ- නැණ පියස ස්ථාපිත කර තිබූ අතර එය මාස 06 ක සිට වසා දමා තිබුණි. ඉහළ මහලේ ස්ථාපිත කර තිබූ රැස්වීම් ශාලාව ඌන උපයෝජිතව තිබුණි. ළමා උද්‍යානයේ ස්ථාපනය කර තිබූ රු. 652,000 ක් වටිනා ළමා උපකරණ සහ උපාංග නොසලකා හැර භාවිතයට නොගෙන ඌන උපයෝජිතව තිබුණි.	මෙම බහුකාර්ය ගොඩනැගිල්ල මහජන සේවාවන් සඳහා යොදා ගන්නා අතර එය ඌන උපයෝජිත ගොඩනැගිල්ලක් ලෙස නොපවති.	ව්‍යාපෘති අරමුණු සඳහා වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	**මිනිපේ** - රුපියල් මිලියන 71 ක මුදලක් වැය කරමින් ඉදිකරන ලද මෙම බහුකාර්ය ගොඩනැගිල්ලේ දෙවන මහලේ පුස්තකාලය සහ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමට සැලසුම් කර තිබුණද, වසර 10 ක් ගතවී ඇතත්, එම මහලේ වැඩ නිම කර අපේක්ෂිත කාර්යය සඳහා පරිශ්‍රය භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි.	රජයේ ආයතන සමඟ ඒ පිළිබඳව සාකච්ඡා පවත්වා ඇතත්, මෙම මහල ආදායම් උත්පාදනය කිරීමේ අරමුණක් සඳහා මෙතෙක් භාවිතා කිරීමට නොහැකි වී තිබේ.	ව්‍යාපෘති අරමුණු සඳහා වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ඌ)	**තිරප්පනේ** - 2016 ජුනි 06 වන දින රුපියල් මිලියන 42.51 ක වියදමින් ඉදිකිරීම් අවසන් කරන ලද මහජන පුස්තකාලයක් වන මෙහි ක්‍රියාකාරී සාමාජිකයින් සංඛ්‍යාව 60 කට සීමා වී තිබුණි. පහළ මහලේ ඉතිරි කොටස සෞඛ්‍ය සායනය පැවැත්වීම සඳහා වෙන් කර තිබුණද, එය අක්‍රියව පැවතුනි. ළමා කටයුතු, ආගමික සහ පොදු කටයුතු සඳහා ශ්‍රවණාගාරය නොමිලේ ලබා දෙන අතර කුලී පදනම මත ලබා දීමේදී ඉල්ලුම බෙහෙවින් අඩු විය. ඒ අනුව, 2019	සභාව පෙන්වා දී ඇත්තේ මෙම ගොඩනැගිල්ල ආදායම් උත්පාදන මාර්ගවලින් ඔබ්බට ගිය සේවා සැපයීමේ අරමුණු සඳහා යොදා ගන්නා අත්‍යවශ්‍ය ගොඩනැගිල්ලක් බවයි.	ව්‍යාපෘති අරමුණු සඳහා වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළයුතුය.

	සිට 2025 දක්වා කාලය තුළ ප්‍රාදේශීය සභාවට ලැබුණු මුළු ආදායම රු. 44,800 ක් පමණි.		

2.1.2 බස් නැවතුම් පොළවල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශයන්
(අ)	**මීගහකිවුල** - රුපියල් මිලියන 33.51 ක වියදමින් ඉදිකරන ලද මෙම බස් නැවතුම්පොළ ඉදිකිරීමට පෙර සකස් කළ යුතු ආර්ථික හා සමාජීය ශක්‍යතා අධ්‍යයන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොමැත. ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් පවරා නොගෙන ඉදිකරන ලද බස් නැවතුම්පොළ වසර 08 ක කාලයක් තිස්සේ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. තවද, ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා සභාවේ ප්‍රතිපාදන නොමැති වීම සහ බාහිර පාර්ශවයන්ගෙන් ද ප්‍රතිපාදන ලබා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් බස් නැවතුම්පොළ ප්‍රයෝජනයට ගැනීම අවිනිශ්චිතව පවතින බව නිරීක්ෂණය විය.	අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා 2025.09.18 දින ඌව පළාත් පාලන කොමසාරිස් හරහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිඛිතව දැනුම් දී ඇත. ඒ අනුව, එම සංවර්ධන කටයුතු අවසන් වන තුරු නගරයේ සිට ග්‍රාමීය මාර්ග බස් රථ ධාවනය කිරීමට දැනටමත් පියවර ගෙන ඇත.	ව්‍යාපෘති අරමුණු සඳහා වත්කම් ඵලදායී උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	**මාවතගම** -බස් නැවතුම්පොළේ ඉඩමෙන් අපේක්ෂා කරන වාර්ෂික ආදායම වන රුපියල් මිලියන 5.70 න්, රුපියල් මිලියන 1.28 ක් පමණක් වර්තමානයේ උපයා ගත හැකි බව නිරීක්ෂණය විය. මෙම බස් නැවතුම්පොළේ කුටි සඳහා කුලිය හැරුණු විට, රුපියල් මිලියන 43.79 ක වියදමින් සේවා පහසුකම් ගොඩනැගිල්ලක් සහ පොදු වැසිකිළි පද්ධතියක් සහිතව ඉදිකරන ලදී.	මාවතගම ප්‍රාදේශීය සභාවට අයත් පුරනැගුම ව්‍යාපෘතිය මගින් ඉදිකරන ලද මෙම බස් නැවතුම්පොළේ බිම් මහලේ ඉදිකිරීම් පමණක් සිදු කර ඇති අතර, මේ දක්වා බස් නැවතුම්පොළෙන් උපයන ආදායම ලබාගෙන ඇත.	ව්‍යාපෘති අරමුණු සඳහා වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

2.1.3 පානීය ජල ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශයන්
(අ) විල්ගමුව ජල යෝජනා ක්‍රමය		
2015 වර්ෂයේදී විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හෙට්ටිපොළ ජල යෝජනා ක්‍රමය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 57.19 ක් වැය කර ඇති අතර මෙම ව්‍යාපෘතිය මඟින් ජල සම්බන්ධතා 350,400 ක් සැපයීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ජල සම්බන්ධතා 165 ක් පමණක් සැපයිය හැකි විය. ඉදිකරන ලද ළිදේ ජල ධාරිතාව 2025 මැයි වන විටත් නොතිබූ බැවින්, ඒ සඳහා පිළියමක් ලෙස අසල පිහිටි පෞද්ගලික ළිදකින් ජලය පොම්ප කර බෙදා හැරීමට කටයුතු කර තිබුණි. 2015 වර්ෂයේදී ජල ගබඩා ටැංකියක් ඉදිකර තිබුණද, 2023 වර්ෂයේදී අමුනෙයාය ප්‍රදේශයේ ලීටර් 30,000 ක ධාරිතාවයකින් යුත් ෆෙරෝස්මන්ට් ජල ගබඩා ටැංකියක් ඉදිකර තිබුණි. මෙම ජල ගබඩා ටැංකිය පිරවීම සඳහා ජල ප්‍රභවය ප්‍රමාණවත් නොවීම සහ ගබඩා ටැංකිය සඳහා දරන ලද වියදම ආර්ථික වශයෙන් අසාර්ථක වී තිබුණි. ක්ලෝරිනීකරණයකින් තොරව පාරිභෝගිකයාට ජලය සපයා ඇති අතර, එම නිසා පිරිසිදු ජලය සැපයීමට පියවර ගෙන නොමැත.	මෙම ව්‍යාපෘතිය සඳහා ජලය කෘෂි ළිදකින් ලබා ගන්නා අතර එම ජලය ජල පෙරහන් හරහා පිරිසිදු කර ජල ගබඩා ටැංකියට මුදා හරිනු ලැබේ. ඉන්පසුව, ජලය ජල ටැංකි දෙකකට පොම්ප කර මෙම ව්‍යාපෘතිය හරහා පාරිභෝගිකයින් 167 දෙනෙකුට ජලය සපයනු ලැබේ. එළුවන කන්ද සහ විල්ගමුව ව්‍යාපෘති දෙකෙහිම ජල පෝෂක ප්‍රදේශ අධික උෂ්ණත්වය පවතින කාලවලදී වියළී යන බැවින්, පාරිභෝගිකයින්ට ජලය ගබඩා නොකර ජල පොම්ප හරහා සෘජුවම ජලය සැපයීමට සිදුවේ. කෙසේ වෙතත්, ජල ගැටලුවට විසඳුමක් ලෙස, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් විල්ගමුව අධිකාරි ප්‍රදේශය ආවරණය වන පරිදි ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ.	සැලසුම් කළ ජල සම්බන්ධතා ලබා දීමට වහාම කටයුතු කළ යුතුය.

(ආ) **ලග්ගල පල්ලේගම ජල ව්‍යාපෘතිය**

ලග්ගල පල්ලේගම සහා බල ප්‍රදේශයේ රුපියල් මිලියන 58.57 ක මුදලක් වැය කරමින් ඉදිකරන ලද පුවක්පිටිය ජල යෝජනා ක්‍රමය යටතේ පවුල් 328 කට ජලය සැපයීමට සැලසුම් කර තිබුණද, පවුල් 103 කට ජලය සැපයීමට කටයුතු කර තිබුණි. නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන් මෙම ව්‍යාපෘතිය තෝරාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

මෙම ව්‍යාපෘතියේ ජලය ක්ලෝරීනීකරණය කිරීම සඳහා ඉදිකරන ලද කාමරය එදින සිටම ප්‍රයෝජනයට ගෙන නොමැති අතර ක්ලෝරිනීකරණයකින් තොරව පාරිභෝගිකයාට ජලය සැපයීමට කටයුතු කර ඇති අතර ජල සාම්පල ද පරීක්ෂා කර නොමැත.

මෙම ව්‍යාපෘතිය මගින් පාරිභෝගිකයින් 142 දෙනෙකුට ජලය සපයයි. මෙම යෝජනා ක්‍රමයේ ජලය ක්ලෝරිනීකරණය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් වැඩපිළිවෙලක් සකස් කර ඇතත්, ක්ලෝරිනීකරණය තාවකාලිකව නතර කර ඇත. තවද, මෙම ව්‍යාපෘතියේ යම් කොටසක් ගිලා බැසීම සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සඳහා ව්‍යුහාත්මක දැනුමක් ඇති ඉංජිනේරුවෙකුගේ නිර්දේශ ඉදිරිපත් කරන ලෙස පළාත් පාලන ඉංජිනේරුවරයාට දැනටමත් දැනුම් දී ඇත.

සැලසුම් කළ ජල සම්බන්ධතා ලබා දීමට වහාම කටයුතු කළ යුතුය.